2

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
கால்நடை உற்பத்தி, சுகாதாரத் திணைக்களம்
DEPARTMENT OF ANIMAL PRODUCTION & HEALTH

මගේ අංකය / எனது இல. /My No.: දෙපාර්තමේන්තු චක්‍රලේඛ 02/2013

DAPH/FD/2/1/2013/4

ඔබේ අංකය / உமது இல. /Your No.:

දිනය / திகதி/Date: 2013.04. 29

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ලැබුණේ 06 MAY 2013 ප්‍රධාන කාර්යාලය පේරාදෙණිය

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියලුම අධ්‍යක්ෂවරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්,
සහ ඒකක ප්‍රධානින් වෙත.

**<u>මාසික ජල බිල්පත් හා විදුලි බිල්පත් සඳහා කඩිනමින් ගෙවීම් කිරීම.</u>**

මාසික ජල බිල්පත් හා විදුලි බිල්පත් නියමිත දිනට නිරවුල් කිරීම සිදු නොවන බව මාගේ අවධානයට ලක් වී ඇත.

ජල බිල්පත් හා විදුලි බිල්පත් ගෙවීමේදී සිදුවන ප්‍රමාදයන් හේතුවෙන් අධිභාරයක් ගෙවීමට සිදුවීමත් නිරතුරුව විගණන විමසුම් වලට භාජනය වීමත් සිදුවන බැවින් ඒවායින් වැළකීම හා අවම කිරීම සඳහා පහත සඳහන් උපදෙස් පරයේ පිළිපදින මෙන් මෙයින් දන්වා සිටිමි.

01. ප්‍රධාන කාර්යාලය හා ඒ ආසන්න කාර්යාල / ඒකක වල බිල්පත් ඉතා කඩිනමින් ගෙවීම සඳහා මුදල් අංශයට ඉදිරිපත් කිරීම.
02. බිල්පත් ලැබුණු දිනය, වවුචර්පත් සකස් කර නිර්දේශ / අනුමත කළ දිනය හා මුදල් අංශයට යොමුකළ දිනය ආදි තොරතුරු ඇතුලත් ලේඛණයක් අංශවල තඩත්තු කිරීම.
03. වවුචර්පත් ලැබුණු දිනය, ගෙවීම් කළ දිනය, චෙක්පත් අංකය ආදි තොරතුරු ඇතුලත් ලේඛණයක් මුදල් අංශය තුළ නඩත්තු කිරීම.
04. මුදල් අංශයට ලැබෙන වවුචර්පත් නොපමාව හා කඩිනමින් සහතික කර ගෙවීම් කිරීම සඳහා ඉදිරිපත් කිරීමට අදාළ විෂයභාර නිලධාරීන් කටයුතු කිරීම.

තවද නියමිත දිනට ගෙවීම් කටයුතු කිරීමට නොහැකි වීමෙන් අධි ගාස්තු අය කරන බිල්පත් සඳහා ප්‍රමාදයට වගකිව යුතු නිලධාරියාගෙන් එම අධි ගාස්තුව අය කිරීමට කටයුතු කරන බවද මෙයින් දන්වමි.

අධි ගාස්තුව ගෙවීම නිසා වාර්ෂික ඇස්තමේන්තුවෙන් වෙන් වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා වර්ෂයේ ඉදිරි බිල්පත් සඳහා ගෙවීම් කිරීම ගැටළුවක් වේ.

එබැවින් අධි ගාස්තු අය කිරීමෙන් තොරව නිසි කලට බිල්පත් ගෙවීම සඳහා නිලධාරීන් දැනුවත් කරන මෙන් වැඩි දුරටත් දන්වමි.

එසේම ජල හා විදුලි බිල්පත් සඳහා ගෙවීම් කිරීමේදී වන ප්‍රමාදයන් සඳහා අදාළ අධ්‍යක්ෂවරයා හෝ ඒකක ප්‍රධානියා සෘජුවම නිදහසට කරුණු දැක්විය යුතු බවද මෙයින් අවධාරණය කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

AP/5

පිටපත :- ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන) - දැ. පි.

තැ. පෙ. / த. பெ./P. O. BOX 13, පේරාදෙණිය. /பேராதனை/Peradeniya : 20400 ශ්‍රී ලංකා / இலங்கை/Sri Lanka

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General | 081 – 2388195 | කාර්යාලය / அலுவலகம் / Office | 081 - 2388189<br>081 - 2388462<br>081 - 2388120 | ෆැක්ස් / பெக்ஸ் / Fax | 081 - 2388619 | විදුලි පණිවුඩ / தந்தி / Telegrams | "පශු පාලන" / "கால்நடை" / "Veterinary" |

E-mail : dgaph@sltnet.lk Web: www.daph.gov.lk